**හදිසි නිකුත් කිරීම සඳහා**

# ශ්‍රී ලංකාව : අසමත් මානව හිමිකම් සවිස්තර වාර්ථාව

***යුධ අපරාධ සඳහා යුක්තිය ඉටුකිරීමට බධා පැමිණවීම හා සිවිල් සමාජයට ප්‍රහාර එල්ලකිරීම***

(2013 ජනවාරි 31, ලන්ඩනය) - 2009 වසරේදී අවසන් වූ ආයුධ සන්නද්ධ අරගලය අතර තුර සිදුවූ යුධ අපරාධ සම්බන්ධයෙන් අර්ථවත් වගවීමේ ක්‍රියාවලියක් ආරම්භ කිරීමට අසමත්වූ ශ්‍රී ලංකා රජය, සිවිල් සමාජයට ද දිගින් දිගටම සිය ප්‍රහාරයන් එල්ල කරමින් සිටින බව 2013 වසර සඳහා වූ  සිය ලෝක වාර්ථාව නිකුත් කරමින් හියුමන් රයිට්ස් වොච් සංවිධානය අද කියාසිටියා.

අරාබි වසන්තයේ දුර්විපාකද ඇතුලුව රටවල් 90 කට වැඩි සංඛ්‍යාවක, පසුගිය වසර තුළ මානව හිමිකම් හී ප්‍රගතිය පිළිබඳව විශ්ලේෂණයක්, පිටු 665 කින් සමන්විත සිය ලෝක වාර්ථාවේ හියුමන් රයිට්ස් වොච් සංවිධානය ඇතුලත් කර ඇත.

හියුමන් රයිට්ස් වොච් ප්‍රකාශ කරන්නේ, පසුගිය වසරේ ශ්‍රී ලංකාව තුළ ප්‍රධාන මානව හිමිකම් කරුණු සම්බන්ධයෙන් මූලික ප්‍රගතියක් සිදුවී නොමැති බවයි. විවිධ නීති හා රෙගුලාසි යටතේ ප්‍රමාණය ඉක්මවා ගිය රඳවා තබාගැනීමේ පුළුල් බළතල පවතින තත්ත්වයක් තුළ දහස් ගනනක් ජනයා චෝදනා ගොනු කිරීමකින් තොරව රඳවා ගෙන සිටින අතර රජයේ ආරක්ෂක හමුදාවන් විසින් සුළුතර දෙමළ ජනයාට එරෙහිව ලිංගික අඩන්තේට්ටම් මෙන්ම අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම් හා වධහිංසා ද පමුනුවනු ලබයි. හියුමන් රයිට්ස් වොච් ගවේෂණයක් මගින් සොයාගත් පරිදි  පරාජිත දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානයට සම්බන්දකම් පැවැත්වූවා යැයි චෝදනාවට ලක්වූ, නැවත ගම්බිම් බලා පැමිණි දෙමළ ජාතිකයන් දැඩි අවධානමක පසුවේ. මානුෂීය අධාර කණ්ඩායම් හි ආධාර නිරන්තරයෙන් උතුරේ දෙමළ ජනයා වෙත සැපයෙන අතර හමුදාව නිරන්තරයෙන් රැඳී සිටීම ජන ජීවිත සමාන්‍යවීම වලක්වන්නට හේතුවී ඇත.

''යුද්ධයෙන් පීඩාවට පත් උතුරු නැගෙනහිර ජනයාගේ මූලික අයිතිවාසිකම් නොසලකා හැරීම නිසා ඇතිවී තිබෙන ගැටළු සඳහා ශ්‍රී ලංකා රජය පිළියම් සෙවිය යුතු බව'' හියුමන් රයිට්ස් වොච් ආසියානු අධ්‍යක්ෂක බ්‍රැඩ් ඇඩම් පවසයි. ''අසාධාරණයට ලක්වූවන්ට යුක්තිය ලැබීම හා වගවීම, රැඳවුම් භාරයේදී සිදුවන වධහිංසා නැවැත්වීම හා මූලික නිදහසට සිදුකරන බාධා ඉවත්වීම වැනි කරුණු සම්බන්ධව දෙමළ ජනතාව තුළ පවතින්නේ අවිනිශ්චිත භාවයක් බව ඔහු වැඩිදුරටත් පැවසීය.''

යුද්ධ වකවානුව තුළ සිදුවූ නීති කඩකිරීම් පිළිබඳව විමර්ශනය කිරීමට රජය දිගින් දිගමට අපොහොසත් වීමට ප්‍රතිචාර ලෙස එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය 2012 මාර්තු මාසයේදී සම්මත කරගන්නා ලද යෝජනාව මඟින් යුක්තිය හා වගවීම තහවුරු කිරීම සඳහා අත්‍යාවශ්‍ය සියලු පියවර ගන්නා ලෙස ශ්‍රී ලංකාවට දන්වනු ලැබුවා. වගවීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග මෙන්ම රජය විසින් ම පත්කරණ ලද උගත් පාඩම් ප්‍රතිසංස්කරණ කොමිසමේ නිර්දේශයන් ක්‍රියාවේ යෙදවීම සඳහා ඔවුන් විසින් ගන්නා ලද පියවරයන් සවිස්තරව දක්වෙන සැලැස්මක් ඉදිරිපත් කිරීම කඩිනම් කරනලෙස ද එම වාර්ථාව මඟින් ඉල්ලා සිටියා. එයට පිළිතුරු ලෙස රජය යථාර්තවාදී නොවන කාළසටහනක් සහිත සැකකටයුතු ''ක්‍රියාකාරී සැලැස්මක්'' හා නීතියට පිටස්තරව සිදුවූ අපරාධ හා සිවිල් වැසියන්ගේ මරණ වලට වගකිව යුත්තන්ට දඬුවම් පැමිණ වීම වැනි කරුණු පිළිබඳව රජයේ දෝෂ සහිත ක්‍රියා පිළිවෙල ඉදිරිපත් කරනු ලැබුවා. මානව හිමිකම් කොමිසමේ යොජනාව මඟින් ස්ථාපිත කරන ලද නිර්දේශ ක්‍රියාවට නැංවීම සඳහා ගතයුතු නිශ්චිත පියවරයන් පිළිබඳව කිසිදු විස්තරයක් මෙතෙක් රජය විසින් ප්‍රසිද්ධියට පත්කොට නැත.

මානව හිමිකම් ආරක්ෂා කිරීම පිලිබඳ සිය නොකැමැත්ත තවදුරටත් ප්‍රදර්ශනය කරමින් 2012 නොවැම්බර් මාසයේදී මානව හිමිකම් කවුන්සිලයට පෙර පැවති විශ්ව කාලපරිච්ඡේද සමාලෝචනය (Universal Periodic Review) අතරතුර දී වගවීම පිළිබඳව කෙළින්ම බලපාන්නාවූ කරුණුද ඇතුළත්ව සමාජික රටවල් විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ 100 ක් පමණ රජය විසින් නිශ්ප්‍රභා කෙරිනි.

''මාර්තු මාසයේ මානව හිමිකම් කවුන්සිලයේදී හා නොවැම්බර් මස විශ්ව කාලපරිච්ඡේද සමාලෝචනය (Universal Periodic Review) අතර තුර දී එක්සත් ජාතින්ගේ සාමාජික රටවල් පැහැදිළිව පෙන්වා දුන් ලෙස ශ්‍රී ලංකාව මානව හිමිකම් සඳහා වූ සිය කැපවීමේ ප්‍රගතිය වේගවත් හා අර්ත පූර්ණ ලෙස පෙන්විය යුතුයැයි'' ඇඩම්ස් පවසයි.  ''කල් ඇදගැනීම සඳහාම අතීතයේ තමන් ගෙනගිය උපක්‍රමවලින්  තව දුරටත් ඵල නොවන බව ශ්‍රී ලංකා රජය තේරුම් ගත යුතු අතර සැබෑ ක්‍රියාමාර්ග කරා යොමුවිය යුතුය''

පසුගිය වසර කිහිපය තුළදී අධිකරණය ඇතුළු ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයන්හී ක්‍රියාකාරීත්වය හකුළුවමින් නිදහස් අදහස් දැරීමේ හා රැස්වීම් පැවැත්වීමේ අයිතිය අභිමිකරමින් සිය බලය දිගින් දිගමට වැඩිකර ගැනිම කෙරෙහි ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ ඔහුගේ සහෝදරයින් යොමුවී ඇති බව පෙනේ. රජය විසින් රහසින් ඔත්තු බැලීම හා තර්ජන කිරීම් මඟින් සිවිල් සමාජ සංවිධාන වෙත සිය පීඩනය එල්ලකොට ඇත. රජයේ අනෙකුත් ප්‍රතිපත්ති විවේචනය කරමින් ද යුද්ධය පැවැති කාලයේ සිදුවූ හිංසනයන් වෙනුවෙන් වගවීමේ ක්‍රියාවලියක් ඉල්ලා සිටින මානව හිමිකම් ක්‍රියාකාරින් වෙත රාජ්‍ය නිළධාරීන්ගේ මාධ්‍ය නිවේදන මඟින් මෙන්ම රාජ්‍ය මාධ්‍යයේ කර්කශ තර්ජනයන්ට ද මුහුණ දීමට සිදුවි ඇත.

''වර්ථමාන රජය සිය පැවැත්ම උදෙසා සියළු ජන කොටස් වලට සමානව සැලකීම ඇතුළු ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ක්‍රමය ද බිලිදෙමින් සිටින බවට ඕනැතරම් සාක්ෂි තිබේ'' යැයි ද ඇඩම්ස් තවදුරටත් පැවසීය.

තමන්ගේ සේවකයන් හා තමන්ගෙන් උදවු ලබන ජනතාවගේ ආරක්ෂාව පිළිබඳව දේශීය ක්‍රියාකාරීන් තමන්ගේ දැඩි කනස්සල්ල ප්‍රකාශකර සිටී. 2012 දී තමන් විවේචනය කරන වෙබ් අඩවි පහක් වත් අවම තරමේ රජය විසින් වසා දැමූ අතර වෙබ් අඩවි සඳහා ලියාපදිංචි ගාස්තුවක් හා පීඩාකාරී ලියාදිංචි ක්‍රමයක් ද හඳුන්වා දෙන ලදි. ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ විසින් ඔහුව විවේචනය කරමින් පළවූ ලිපියක් සම්බන්ධයෙන් හිටපු සන්ඩේ ලීඩර් කතුවරියට තර්ජනය කරන ලද බවට ද වාර්ථා විය.

''රජය සිය වැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා නොකරන්නේ නම් ජාත්‍යන්තර බලපෑම් වැඩිකළ යුතු බව ඇඩම්ස් පැවසීය.'' ''2012 වසරේදී ජාත්‍යන්තර ප්‍රජාව ශ්‍රී ලංකාව පිළිබඳ සිය අවධානය අලුත් කළ අතර, දේශපාලන අවකාශය හීනවීම හා වගවීම පිළිබඳව ප්‍රගතියක් නොවීම වැනි තත්ත්වයක් තුළ එම ජාත්‍යන්තර අවධානය දිගින් දිගටම පවත්වා ගත යුතු'' යැයි ද ඇඩම් පැවසීය.